# උතුරු පළාත් සිංහල මාධ්‍යයේ පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවය 3 වන පන්තිය - 1 (අ) ශ්‍රේණියේ තනතුරට උපාධිධාරීන් බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2019

උතුරු පළාත් සිංහල පාසල්වල පවතින ගරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වන පන්තියේ 1 (අ) ශ්‍රේණියේ තනතුරට පළමු (01) ඇමුණුමෙහි සඳහන් පුරප්පාඩුවලට උපාධිධාරීන් බඳවා ගැනීම සඳහා සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. දෙවන ඇමුණුමෙහි **(02) හි** දක්වා ඇති පරිදි අදාළ වූ විෂයයන් සඳහා සුදුසුකම් හිමි අයදුම්කරුවන් පමණක් ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබති පළමු (01) ඇමුණුමෙහි දක්වා ඇති පුරප්පාඩුවලට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් 2019 ජූලි මස වවුනියාව දිස්ත්‍රික්කයේ පැවැත්වීමට නියමිත බව දන්වා සිටිනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 24.06.2019 වේ.

## 02. බඳවා ගැනීමේ සේවා කොන්දේසීන් :-

2.1 **අංක** 1885 / 38 හා 2014.10.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනය මගින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයට අදාළ සේවා ව්‍යවස්ථා සංග්‍රහය මගින් නියම කරන ලද කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසීන් හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක 1817 / 30 හා 2013.07.03 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් නිවේදනය කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවය සඳහා වූ ආයතන ක්‍රියා පටිපාටි සංග්‍රහය යනාදීන්ට අනුකූලව තෝරා ගන්නා අපේක්ෂකයන් අදාළ සේවා තනතුරේ 3 වන පන්තිය - 1(අ) තනතුරට පත් කරනු ලැබේ.

2.2 තරඟ විභාගය හා ප්‍රායෝගික විභාගය මගින් පත්වීමට සුදුසුකම් ලබන අපේක්ෂකයන් පත්වීම් දින සිට වසර තුනක් (03) පරිවාස කාලයට යටත් කර පත්වීම් ලබා දෙන අතර මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරකි.

2.3 මෙම සේවය ස්ථාන මාරුවලට යටත් වූ සේවයක් වන අතර මෙම පත්වීම ලැබීමට සුදුසුකම් ලබන අපේක්ෂකයින් උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක පිහිටි සිංහල මාධ්‍යය පාසලක සේවය කිරීමට බැඳී සිටිය යුතුයි යන කොන්දෙසියට යටත්විය යුතුයි.

2.4 රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 01/2014 හා ඊට අදාළව කලින් කලට නිකුත් කරනු ලබන චක්‍රලේඛවලට අනුව පත්වීමේ දින සිට වසර පහක් (05) ක් අවසන් වීමට ප්‍රථම නියමිත දෙවන රාජ්‍ය භාෂා විභාගයෙන් ප්‍රවීනතාවයද ලබා ගත යුතුයි.

2.5 පත්වීම් සංඛ්‍යාව හා පත්වීම බලාත්මක වන දිනය යනාදි කරුණු පත්වීම් බලධාරියා විසින් නිර්වචනය කරනු ලැබේ. පත්කිරීමට නියමිත සංඛ්‍යාව පළමු (01) ඇමුණුමේ දක්වා ඇති පරිදි වන අතර නිවේදනය කරන ලද පුරප්පාඩු සම්බන්ධයෙන් යම් පුරප්පාඩු හෝ සියළුම පුරප්පාඩු සම්පූර්ණ නොකර සිටීමේ බලය ද පත්වීම් බලධාරියා සතුය.

## 03. වැටුප් පරිමාණය :-

3 වන පන්තිය - 1(අ), ශ්‍රේණියේ තනතුරට අලුතින් බඳවා ගන්නා ගුරුවරයකුට පත්වීම බලගැන්වූ දින සිට අංක 03/2016 දරණ 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි, වැටුප් සංකේත අංක **GE 1 - 2016** වැටුප් සංකේතය යටතේ **රුපියල් 27,740 – 6 x 300 – 7 x 380 – 2 x 445 – 33,090 ක්** වන මාසික වැටුප් පරිමාණයේ, **උප ඇමුණුම I** හි සඳහන් කර ඇති පරිදි 14 වන වැටුප් පියවර වන රුපියල් **32,200/-** හි පිහිටුවනු ලැබේ. කෙසේ වෙතත් ඔවුන්ට අදාළ වැටුප **උප ඇමුණුම II** හි සඳහන් පරිදි **රුපියල් 28, 868/-** ක් ප්‍රදානය කරනු ලැබේ. මීට අමතරව රජය විසින් රජයේ නිලධාරීන්ට කලින් කල ගෙවනු ලබන දීමනා ද ලබා ගැනීමට හිමිකම් ලබයි.

## 04. සාමාන්‍ය සුදුසුකම්:-

04.1 අයදුම්කරුවන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතුයි.

04.2 අයදුම්කරුවන් උතුරු පළාත ස්ථිර පදිංචිය කරගත් අය විය යුතුයි. මෙම අයදුම් අවසන් දිනට ප්‍රථම වසර හයකින් (06) අවම වශයෙන් වසර තුනක්වත් (03) උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවන් විය යුතුයි. **හෝ**

දෙමාපියන්ගේ උපන් ස්ථානය උතුරු පළාත විය යුතු අතර අවම වශයෙන් වසර පහක් (05) උතුරු පළාතේ අඛණ්ඩ පදිංචිකරුවන් විය යුතුයි.

සටහන:- **සම්මුඛ පරීක්ෂණයේදී ග්‍රාම සේවක නිලධාරි විසින් ප්‍රදානය කරන ලද ප්‍රාදේශීය ලේකම්ගේ අනුඅත්සන යෙදූ ඡන්ද හිමි තොරතුරු සටහන් කර ගැනීමට නිකුත් කරන ආකෘතිය ඉදිරිපත් කළ යුතුයි)**

04.3 අයදුම්කරු උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු මනා ශාරීරික යෝග්‍යතාවයකින් හෙබි පුද්ගලයන් විය යුතු අතර මනා චරිතයකින් යුත් පුද්ගලයන් ද විය යුතුයි.

04.4 ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එම දිනට ප්‍රථම අයදුම්කරු විසින් සියළුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුයි.

04.5 ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට අයදුම්කරුගේ වයස අවුරුදු 21 ට නොඅඩු හා වයස අවුරුදු 35 නොවැඩි විය යුතුයි.

## 05. අධ්‍යාපන සුදුසුකම් :-

05.1 අංක *1885/38* දරණ 2014.10.23 වන දින දරණ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනය මගින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයට අදාළ සේවා ව්‍යවස්ථා සංග්‍රහයට අනුකූලව 2019.06.24 වන දින හෝ ඊට ප්‍රථම අධ්‍යාපන විෂය භාර රේඛීය අමාත්‍යාංශය විසින් ගුරු පත්වීමට අදාළව අනුමත කරන ලද විශේෂ විෂය ක්ෂේත්‍රයට අයත් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂම විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂම විසින් අනුමත උපාධි ප්‍රදාන ආයතනයක් මගින් ප්‍රදානය කරන ලද විශ්වවිද්‍යාල උපාධි සුදුසුකම් සහිත සහතිකයක් (02 වන ඇමුණුමෙහි සඳහන් පරිදි) හිමිව තිබිය යුතුයි. ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින අතරතුර ඉදිරිපත් කරන ඉල්ලුම්පත් හා කැඳවා ඇති අධ්‍යාපන සුදුසුකම් පූර්ණය කර නැති ඉල්ලුම්පත් ද පෙර දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ

**තවද**

05.2 අ පො ස.(සා/පෙ) විභාගයේ දී සිංහල භාෂාව සමත්වී තිබිය යුතුයි

## 06. බඳවා ගැනීමේ පටිපාටිය :-

06.1 ලිඛිත පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණ යනාදිය මගින් කුසලතා පදනමින් හා බඳවාගනු ලබන අවස්ථාවේදී බලගැන්වී ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, සේවා ව්‍යවස්ථා සංග්‍රහය ජාතික හා පළාත් ප්‍රතිපත්තීන්ට එකඟව බඳවා ගනු ලැබේ. ඉහත දැන්වීම මගින් කැඳවා ඇති සුදුසුකම් සියල්ල සම්මුඛ පරීක්ෂණයේදී පරීක්ෂාවට ලක් කරනු ලැබේ. අවශ්‍ය සුදුසුකම් නැති බව අනාවරණය වන අවස්ථාවේදී මෙම තනතුර සඳහා ඇති හිමිකම අහෝසි කරනු ලැබේ. තවද මෙම තරඟ විභාගයට කැඳවා ඇති ඉල්ලුම්පත් යොමු කළ විට සුදුසුකම් සහිත එම ඉල්ලුම්පත් අදාළ විෂයට පවතින පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු නම් එම අයදුම්කරුවන්ට ලිඛිත පරීක්ෂණය පැවැත්වෙන්නේ නැති අතර සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය පැවැත්වීමට නියමිතය.

06.2 සුදුසුකම් සහිත අයදුම්කරුවන් අතරින් ලිඛිත විභාගයෙන් සුදුසුකම් ලබන අපේක්ෂකයන් තමන් ලබාගන්නා ලකුණු ප්‍රමාණයේ අනුපිළිවෙළ අනුව සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලැබේ සම්මුඛ පරීක්ෂණයේදී අපේක්ෂකයන් ප්‍රායෝගික පරීක්ෂණයකට පෙනී සිටිය යුතුයි. මේ සඳහා ලකුණු ප්‍රදානය කරනු ලැබේ. නිවේදනයේ 12.2 වැනි ඡේදයේ මේ පිළිබඳ තොරතුරු දක්වා ඇත සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කිරීමට අපොහොසත් වන සහතික සම්බන්ධයෙන් පසුව සැළකිල්ලට ගනු නොලැබේ.

06.3 පුරප්පාඩුවලින් 03% ක් විශේෂිත අවශ්‍යතාවයන් ඇති අය සඳහා (ආබාධිත) වෙන් කරනු ලැබේ. උපාධිපත්වීම සඳහා තෝරා ගන්නා විට අදාළ තනතුරේ සේවය කිරීමට තම විශේෂිත අවශ්‍යතා තත්වය (ආබාධිත තත්වය) බාධාවක් නොවන බව විශේෂ වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මගින් සහතික කළ යුතුයි. කෙසේ වුවද විශේෂිත අවශ්‍යතාවයක් ඇති අපේක්ෂකයෙක් පත්වීම සඳහා සුදුසුකම් ලබන්නේ ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් අවශ්‍ය ලකුණු ප්‍රමාණයක් ලබාගත් විටයි

## 07. විභාග ගාස්තු :-

අයදුම්කරු පදිංචි උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් රුපියල් **500.00** ක වටිනාකම **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත"** ට අයත් **3401** යන තැන්පතු ගිණුමට බැර කරන ලද කුවිතාන්සියක් අයදුම්පතේ අදාළ කොටුව තුළ නොගැළවෙන සේ

අලවා එවිය යුතුයි. කුමණ හේතුවක් නිසා හෝ මෙම විභාග ගාස්තු නැවත ගෙවනු ලබන්නේ නැති අතර මෙම ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට අනුමැතිය දෙන්නේ නැත.

## 08. අයදුම් කරන ක්‍රමය :-

08.1 මෙම දැන්වීම් අවසානයේ ඇති ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූලව A4 ප්‍රමාණයේ (සෙ.මී21 x සෙ.මී 29) කඩදාසියේ 1 සිට 10 දක්වා ඡේද පළමු පිටුවේ ද අනෙක් කොටස් දෙවන පිටුවේ ද අනෙක් කොටස් ඊළඟ කොටසේ ද ඇතුළත් වන සේ අයදුම්පත සකස් කළ යුතුයි. සම්පූර්ණ කරන ලද අයදුම්පත **24.06.2019** වැනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ, **"ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය, උතුරු පළාත, අංක :393/48, කෝවිල් පාර, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුයි.

08.2 ඉල්ලුම්පත්‍රය යොමු කරන ලිපි කවරයේ වම් පස උඩ කෙළවරේ **සිංහල මාධ්‍යයේ පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රීලංකා ගුරු සේවයේ 3 වන පන්තියේ 1(අ) ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය – 2019"** යනුවෙන් සඳහන් කළ යුතුයි.

08.3 ඉල්ලුම්පත් ඉදිරිපත් කරන විට ඔබගේ සුදුසුකම් අනුව **ගැළපෙන විෂයයන්ට** (නිවේදනයේ 02 වන ඇමුණුමෙහි සඳහන් විෂයයන්ට) පමණක් ඉල්ලුම්කරන විට **එම විෂය/විෂයයන් සඳහන් කර එක් ඉල්ලුම්පතක්** පමණක් යොමු කිරීම ප්‍රමාණවත්ය. ඉල්ලුම්කරු විසින් අයදුම් කරන ලද විෂයන්ට අනුකූලව පත්වීම් ප්‍රදානය කරනු ලැබේ. උපාධිධාරීන් ගුරු සේවය සඳහා අයදුම්කරන විෂය/විෂයන් පසුව වෙනස් කිරීමට මොනම හේතුවක් නිසා හෝ ඉඩ දෙන්නේ නැත.

08.4 ඉල්ලුම්පත්‍රයේ **ඡායා පිටපතක්** ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක. අයදුම්පතේ ඡායා පිටපත හා පූර්ව නිශ්චිත පිටපත යනාදී භාරගනු නොලැබේ. විභාගය සඳහා ප්‍රවේශපත්‍ර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරයා විසින් නිකුත් කරනු ලැබේ. විභාගය සඳහා ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම යනු **අපේක්ෂකයා විසින් සියළුම සුදුසුකම් සපුරා ඇති බවට** පිළිගැනීමක් සේ සැළකිය නොයුතුයි.

08.5 විභාගයට අයදුම්කරන අපේක්ෂකයන්ගේ ඉල්ලුම්පත්‍ර ලැබුණු බවට දැන්වීම් කිසිවක් නිකුත් කරනු නොලැබේ. එමෙන්ම ඉල්ලුම්පත් කැඳවීමේ අවසාන දිනට ප්‍රථම කැඳවා ඇති සුදුසුකම් සම්පූර්ණ කර නැති ඉල්ලුම්පත් පෙර දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. මෙම කරුණු සම්බන්ධයෙන් කිසිදු දැන්වීමක් නිකුත් කරනු නොලැබේ.

08.6 ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති සුදුසුකම් ඇති අයදුම්කරුවන්ට ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම පුවත්පත් නිවේදනයකින් ඒ බව දැනුම් දෙනු ලැබේ එම නිවේදනය නිකුත් කිරීමෙන් පසු යම්කිසි අපේක්ෂකයකුට විභාගය පැවැත්වෙන දිනට අඩුම වශයෙන් දින 03 කට පෙර හෝ ප්‍රවේශපත්‍ර ලැබුණේ නැතිනම් ඒ බව පහත සඳහන් තොරතුරු සමග **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය, උතුරු පළාත, අංක 393/48, කෝවිල් වීදිය, නල්ලූර්, යාපනය"** යන ලිපිනයට දැන්විය යුතුයි. (දුරකථන අංකය - 021 221 9939, ෆැක්ස් අංකය - 021 221 9940)

**සටහන** :- ආවරණ ලිපිය, විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම ජාතික හැඳුනුම්පත් අංකය, ඉල්ලුම්කරුගේ තැපැල් ලිපිනය, ඉල්ලුම්පත්‍රයේ පිටපත ඉල්ලුම්පත තැපැල් කරන ලද තැපැල් කන්තෝරුව, ලියාපදිංචි අංකය හා විභාග ගාස්තුව ගෙවූ කුවිතාන්සියේ සහතික කරන ලද පිටපත, ප්‍රවේශ පත්‍රය යොමු කිරීම සඳහා ෆැක්ස් අංකයක්.

## 09. විභාග අපේක්ෂකගේ අනන්‍යතාවය :-

අපේක්ෂකයන් තමා පෙනී සිටින එක් එක් විෂයයන් සම්බන්ධයෙන් විභාග ශාලාධිපති සෑහීමකට පත්වන ආකාරයකට තම අනන්‍යතාවය ඔප්පු කළ යුතුයි. අනන්‍යතාවය ඔප්පු කිරීමට පහත සඳහන් ලේඛනවලින් එක් ලේඛනයක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.
(iii) රියදුරු බලපත්‍රය

ඉහත සඳහන් ලේඛනයක් ඉදිරිපත් කිරීමට අපොහොසත්වන විභාග අපේක්ෂකයකුගේ විභාගයට පෙනී සිටීමේ හිමිකම උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා, ලේකම්ගේ අභිමතය පරිදි

අහෝසි කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයන් නැඹුරු විය යුතුයි. එම නීතිරීති උල්ලංඝනය කළවිට පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් පනවන දඬුවමකට යටත් විය යුතුයි.

## 10. අසත්‍ය තොරතුරු සඳහා දඬුවම් :-

අයදුම්පත් සම්පූර්ණ කරන විට ඉතාමත්ම අවධානයකින් යුතුව නිවැරදි තොරතුරු ඇතුළත් කළ යුතුයි. ඉහත විභාග රේගුලාසීන් ප්‍රකාර යම්කිසි අයදුම්කරුවකු විභාගයට ප්‍රථම හෝ විභාගය පැවැත්වෙන අවස්ථාවේදී හෝ විභාගයෙන් පසුව හෝ සුදුසුකම් නැති බව අනාවරණය වුවහොත් අපේක්ෂකයාගේ අපේක්ෂකත්වය එම අවස්ථාවේදීම අවලංගු කරනු ලැබේ. අයදුම්කරු විසින් ඉදිරිපත් කර ඇති කිසියම් තොරතුරක් අසත්‍ය බව අනාවරණය වන අවස්ථාවකදී පළාත් රාජ්‍ය සේවයෙන්ද පහ කරනු ලැබේ.

## 11. අත්සන සහතික කිරීම :-

**සෑම අපේක්ෂයෙක්ම තම අත්සන සහතික කිරීම අත්‍යාවශ්‍යයි.** රජයේ ආයතනයක් මගින් අයදුම් කරන අපේක්ෂකයෙක් තම ආයතන ප්‍රධානියා හෝ එම ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු මගින් සහතික කර ගත යුතුයි. අනෙක් අයදුම්කරුවන් තම ප්‍රදේශයේ ග්‍රාම සේවක නිලධාරි, සාම විනිසුරු, දිවුරුම් නිලධාරි, නීතිඥ, නොතාරිස්, නාවික හමුදා, යුදහමුදා, ගුවන් හමුදාවන්හි අණදෙන නිලධාරියකු, රුපියල් 447,240.00ට නොඅඩු වටිනාකමකින් යුත් වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන ස්ථිර රජයේ හෝ පළාත් පාලන හෝ පළාත් නිලධාරියෙකු, හෝ ආගමික නායකයකු සනාථ කළ යුතු.

## 12. විභාග පටිපාටිය :-

12ගl ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ වශයෙන් මෙම විභාගය කොටස දෙකකින් යුක්තයි ලිඛිත විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වන අතර මෙම විභාගය සිංහල මාධ්‍යය පාසල්වල පවතින පුරප්පාඩු සඳහා ගුරු සේවයට බඳවා ගැනීමේ තරඟ විභාගයක් වන නිසා අයදුම්කරුවන් ඉහත ලිඛිත විභාගයට පෙනී සිටිය යුත්තේ සිංහල මාධ්‍යයෙන් පමණක් ය.ලිඛිත විභාගයට පෙනී සිට සමත්වීමට අපොහොසත් වන කවර හෝ විභාග අපේක්ෂකයකුට නැවත ප්‍රශ්න පත්‍ර සමීක්ෂණය සඳහා අයදුම් කිරීමට කිසිදු විධිවිධානයක් සලසා නැත.

| අංක | ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය | වෙලාව | ලකුණු |
|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | විභාග අපේක්ෂකයෙකුට ගුරු සේවය සඳහා පිළිඹුවන දක්ෂතාවයන් තර්කානුකූල දැනුම සම්බන්ධ ඇගයීමක් කිරීමේ අරමුණින් මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ලබයි. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු සැපයිය හැකි ප්‍රශ්න 50 කින් යුත් ප්‍රශ්න පත්‍රයකි. සියළුම ප්‍රශ්නවලට කෙටියෙන් පිළිතුරු සැපයිය යුතුයි. | පැය 01 | 100 |
| 02 | සාමාන්‍ය දැනුම | ගුරු ක්ෂේත්‍රයට අදාළව එම ක්ෂේත්‍රය පිළිබඳව ඇති සාමාන්‍ය දැනීම හෝ දේශිය වශයෙන් සිදු වී ඇති හා සිදුවිය හැකි අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳ සාමාන්‍ය දැනුම හා අධ්‍යාපය තුළ ඇතිවී ඇති නවීකරණය පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කිරීමේ බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීම සඳහා සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. | පැය 01 | 100 |

**සටහන** :-

මෙම විභාගය තරඟ විභාගයක් වන බැවින් ප්‍රායෝගික පරීක්ෂණයට සුදුසුකම් ලැබීමට සෑම ප්‍රශ්න පත්‍රයකටම වෙන් කර ඇති ලකුණු ප්‍රමාණයෙන් අවම වශයෙන් ලකුණු හතලිහ බැගින් (40%) අපේක්ෂකයන් ලබා ගත යුතුයි. එමෙන්ම සම්මුඛ පරීක්ෂණයේදී අයදුම්කරුවන් ලබාගත් සම්පූර්ණ ලකුණු ප්‍රමාණයේ අනුපිළිවෙළ (merit order) සැලකිල්ලට ගනු ලැබේ.

### 12.2 ප්‍රායෝගික පරීක්ෂණය

ලිඛිත විභාගයෙන් සමත් වූ අපේක්ෂකයන් ව්‍යවහාරික පරීක්ෂණය සඳහා අයදුම්කරු තමා විසින් හඳුනාගත් තේමාව යටතේ එය ඉදිරිපත් කළ යුතුයි. මේ සඳහා පහත සඳහන් පරිදි ලකුණු ප්‍රදානය කරනු ලැබේ.

| ව්‍යවහාර පරීක්ෂණයට ලකුණු ප්‍රදානය කරන ලක්ෂණය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත්වීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01. අරමුණු හා ප්‍රවේශය<br>**(Objective and the Approach)** | 05 | 02 |
| 02. පෞරුෂත්වය හා හඬ පාලනය<br>**(Personality and Voice Control)** | 05 | 02 |
| 03. සන්නිවේදනයේ පැහැදිලි භාවය<br>**(Clarity in the Communication)** | 05 | 02 |
| 04. කාල කළමනාකරණය<br>**(Time Management)** | 05 | 02 |
| 05. ඉදිරිපත් කිරීමේදී තාක්ෂණික ක්‍රම භාවිතය<br>**(Usage of Techniques of Presentation)** | 05 | 02 |
| **සම්පූර්ණ** | **25** | **10** |

**සටහන:**

තරග විභාගයෙන් සමත්වන විභාග අපේක්ෂකයන්ගෙන්, අංක 1885/38 හා 2014.10.23 වන දින දරණ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය මගින් නිර්දේශිත ප්‍රායෝගික පරීක්ෂණය සඳහා අපේක්ෂකයන් කැඳවනු ලැබේ.

## 13. විභාග ප්‍රතිඵල :-

අපේක්ෂකයන්ගේ විභාග ප්‍රතිඵල, උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් www.np.gov.lk යන උතුරු පළාත් අන්තර් ජාලය මගින් පළ කරනු ලබන අතර විභාගයට පෙනී සිටි සියළුම විභාග අපේක්ෂකයන්ගේ ප්‍රතිඵල තැපැල් මගින් නිකුත් කරනු ලැබේ.

**14.** මෙම විභාගය පැවැත්වීම් හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන් වූ සියළුම බලතල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් සතුව ඇත.

**15.** ඉහත විභාගය සම්බන්ධ දැන්වීම www.np.gov.lk යන උතුරු පළාත් සභාවෙ වෙබ් අඩවියට පිවිසීමෙන් තොරතුරු ලබාගත හැකිය

***අ. සිවබාලසුන්දරන්,***
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.
24.05.2019

# විෂයයන් අනුව පවතින පුරප්පාඩු

| අංකය | විෂයය | පවතින පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|
| **01** | විද්‍යාව | 06 |
| **02** | ගණිතය | 11 |
| **03** | චිත්‍ර | 10 |
| **04** | නාට්‍ය හා රංග කලාව | 01 |
| **05** | කෘෂිකර්මය | 05 |
| **06** | ගෘහ විද්‍යාව | 04 |
| **07** | විශේෂ අධ්‍යාපනය | 03 |
| **08** | ශිෂ්ටාචාරය | 01 |
| **09** | මඟපෙන්වීම හා උපදේශන | 03 |
| **සම්පූර්ණ පුරප්පාඩු සංඛ්‍යාව** | | **44** |

## විෂය ගණය හා අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම්

| විෂය අංකය | විෂය ගණය | අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|
| I | විද්‍යාව | අනුමත විශ්වවිද්‍යාලයකින් ජීව විද්‍යාව/රසායන විද්‍යාව/භෞතික විද්‍යාව යන විෂයයන් ප්‍රධාන විෂයන් ගෙන් එක් විෂයක් කරගත්/විශේෂ පාඨමක් කර ගත් විද්‍යාවේදී උපාධිධාරියකු විය යුතුයි<br>හෝ<br>අනුමත විශ්වවිද්‍යාලයකින් ජීව විද්‍යාව/ ජීව විද්‍යා ක්ෂේත්‍රයට අදාළ (කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාල පාඨමාලාව/ආහාර පෝෂණය වැනි) විෂයන්ගෙන් එකක් කොටගත්/විශේෂ පාඨමක් කරගත් විද්‍යාවේදී උපාධිධාරියකු විය යුතුයි |
| II | ගණිතය | අනුමත විශ්වවිද්‍යාලයකින් ශුද්ධගණිතය ප්‍රායෝගික ගණිතය යන විෂයන් දෙකම ප්‍රධාන විෂයන් කරගත් විද්‍යාවේදී උපාධිධාරියකු විය යුතුයි |
| III | චිත්‍රය | අනුමත විශ්වවිද්‍යාලයකින් චිත්‍රකලාව ප්‍රධාන විෂයන් අතුරින් එක් විෂයක්/විශේෂ පාඨමක් ලෙස ශාස්ත්‍රවේදී උපාධිධාරියකු විය යුතුයි |
| IV | නාට්‍ය හා රංග කලාව | අනුමත විශ්වවිද්‍යාලයකින් නාට්‍ය හා රංග කලාව ප්‍රධාන විෂයක් කොටගත් /විශේෂ පාඨමක් ලෙස ශාස්ත්‍රවේදී උපාධිධාරියකු විය යුතුයි |
| V | කෘෂි කර්මය | අනුමත විශ්වවිද්‍යාලයකින් කෘෂිකර්ම විෂය ප්‍රධාන විෂයන් අතුරින් එක් විෂයක්/විශේෂ පාඨමක් ලෙස විද්‍යාවේදී උපාධිධාරියකු විය යුතුයි |
| VI | ගෘහවිද්‍යාව | අනුමත විශ්වවිද්‍යාලයකින් ගෘහවිද්‍යාව ප්‍රධාන විෂයන් අතුරින් එක් විෂයක්/විශේෂ පාඨමක් ලෙස ශාස්ත්‍රවේදී උපාධිධාරියකු විය යුතුයි |
| VII | විශේෂ අධ්‍යාපනය | අනුමත විශ්වවිද්‍යාලයකින් විශේෂ අධ්‍යාපනය සම්බන්ධයෙන් ශාස්ත්‍රවේදී උපාධිධාරියකු විය යුතුයි |
| VIII | ශිෂ්ටාචාරය | අනුමත විශ්වවිද්‍යාලයකින් දේශපාලන විද්‍යාව ප්‍රධාන විෂයන් අතුරින් එක් විෂයක්/විශේෂ පාඨමක් ලෙස ශාස්ත්‍රවේදී උපාධිධාරියකු විය යුතුයි |
| | මගපෙන්වීම හා උපදේශන | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම විසින් අනුමත කරන ලද උපාධි ප්‍රදාන ආයතනයකින් මනෝවිද්‍යා විෂය ප්‍රධාන විෂයන් අතරින් එකක් ලෙස/විශේෂ උපාධිධාරී උපාධිය ලබාගෙන තිබිය යුතුයි<br>**හෝ**<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම විසින් අනුමත කරන ලද උපාධි ප්‍රදාන ආයතනයකින් මනෝවිද්‍යා විෂය විෂයක් ලෙස සමාජ සේවා (Social Work) උපාධිධාරී උපාධිය ලබාගෙන තිබිය යුතුයි<br>**හෝ**<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම විසින් අනුමත කරන ලද උපාධි ප්‍රදාන ආයතනයකින් සමාජවිද්‍යා විෂය ප්‍රධාන විෂයන් අතරින් එකක් ලෙස/විශේෂ උපාධිධාරී උපාධිය ලබාගෙන තිබිය යුතුයි<br>**ඒ සමඟම**<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම විසින් අනුමත කරන ලද උපාධි ප්‍රදාන ආයතනයකින් හෝ තෘතීය අධ්‍යාපන කොමිෂම විසින් අනුමත ආයතනයකින් ලබාගත් වර්ෂයකට නොඅඩු (මාස 12) උපදේශන (මගපෙන්වීම හා උපදෙස්) හා සම්බන්ධ පශ්චාත් ඩිප්ලෝමා උපාධි සහතිකය.<br>**හෝ**<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම විසින් අනුමත කරන ලද විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම විසින් අනුමත කරන ලද උපාධි ප්‍රදාන ආයතනයකින් හෝ තෘතීය අධ්‍යාපන කොමිෂම විසින් අනුමත ආයතනයකින් ලබාගත් වර්ෂයකට නොඅඩු (මාස 12) උපදේශන (මගපෙන්වීම හා උපදෙස්) හා සම්බන්ධ ඩිප්ලෝමා පාඨමාලා සහතිකය |